ප්‍රවෘත්ති අධ්‍යක්ෂ/ප්‍රවෘත්ති සංස්කාරක 2016 පෙබරවාරි 05

# ප්‍රවෘත්ති නිවේදනය

## නිෂ්පාදකයාගේ මිල දර්ශකය (පදනම: 2013 සිව්වන කාර්තුව = 100) :- 2015 සිව්වන කාර්තුව

## ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

## ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශය

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව අළුතින් හඳුන්වාදෙන ලද නිෂ්පාදකයාගේ මිල දර්ශකය 2015 දෙවන කාර්තුවේ සිට අදාළ කාර්තුව අවසන් වී සති 5කට පසු ප්‍රකාශයට පත් කරනු ලැබේ. ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව මගින් මෙම දර්ශකය හඳුන්වාදීමත් සමඟ, නිෂ්පාදකයාගේ මිල හා පාරිභෝගිකයාගේ මිල දක්වා ආර්ථිකයේ මිල සංඛ්‍යාති ව්‍යුහය පිළිබඳ සම්පූර්ණ ආවරණයක් සිදුකරයි.

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව 2015 සිව්වන කාර්තුව සඳහා නවතම නිෂ්පාදකයාගේ මිල දර්ශකය ප්‍රකාශයට පත් කර ඇත. 2015 ඔක්තෝම්බර්, නොවැම්බර් සහ දෙසැම්බර් යන මාසවල සියළුම ආර්ථික කටයුතු (කෘෂිකර්ම, නිෂ්පාදන කර්මාන්ත, විදුලිය හා ජලය) සඳහා නිෂ්පාදකයාගේ මිල දර්ශක අගයන් පිළිවෙලින් 106.0, 106.3 හා 107.1 වේ. පසුගිය වර්ෂයේ සිව්වන කාර්තුවේ අදාළ මාස සමඟ සන්සන්දනයේ දී සමස්ත දර්ශකය ඔක්තෝම්බර් මාසයේ 2.4% ක ද, නොවැම්බර් මාසයේ 4.2% ක ද, දෙසැම්බර් මාසයේ 4.8% ක ද වැඩිවීමක් පෙන්නුම් කරයි. පසුගිය වර්ෂයේ සිව්වන කාර්තුවේ අදාළ මාස සමඟ සන්සන්දනයේ දී 2015 සිව්වන කාර්තුවේ මුල් මාස දෙකෙහි කෘෂිකාර්මික හා නිෂ්පාදන කර්මාන්ත අංශයේ මිල දර්ශකයන්ගේ වැඩිවීමක් වාර්තා වී ඇති අතර, විදුලිය හා ජල සැපයුම් අංශය සඳහා වන දර්ශකයන්හි අඩුවීමක් වාර්තා වී ඇත. නමුත් විදුලිය හා ජල සැපයුම් අංශයේ සුළු වැඩිවීමක් දෙසැම්බර් මාසයේ වාර්තා වේ.

2015 සිව්වන කාර්තුව සඳහා, අනුයාත මාස 2ක් අතර සැසඳීමේදී සියළුම අයිතමයන්ගේ දර්ශකයේ සුළු වර්ධනයක් පවතී. ප්‍රධාන ආර්ථික කටයුතු වෙන්වෙන් වශයෙන් සළකා බැලූවිට, කෘෂිකාර්මික හා නිෂ්පාදන කර්මාන්ත අංශයේ නිෂ්පාදකයාගේ මිල දර්ශකයන්හි නිරන්තර වර්ධනයක් වාර්තා වී ඇත. අනුයාත මාස 2ක් සැසඳීමේදී පසුගිය මාස 3ක කාලය පුරාම උපයෝගිතා අංශය සෘණ වර්ධනයක් වාර්තා වී ඇත.

දේශීය නිෂ්පාදකයන්ට තමන් විසින් නිෂ්පාදනය කරනු ලබන භාණ්ඩ හා සේවා සඳහා ලැබෙන සාමාන්‍ය මිල ගණන්වල කාලයත් සමඟ සිදුවන වෙනස්වීම මෙමගින් මනිනු ලබයි. නිෂ්පාදකයාගේ මිල දර්ශකය හඳුන්වාදීම තුළින් වෙළඳපොල මිල ගණන්වල සිදුවන විචලනයන් වඩා නිවැරදි ව පෙන්නුම් කරන අතර එම ප්‍රවණතා උපයෝගී කර ගනිමින් වඩාත් නිවැරදි තීරණ ගැනීමට හැකියාව ලැබේ.

තව ද, මෙය වැදගත් සාර්ව ආර්ථික දර්ශකයක් වේ. එමෙන්ම මෙය කෙටි කාලීනව ඇතිවිය හැකි උද්ධමන තත්වයන් පුරෝකථනය කළ හැකි සංඥාවක් ලෙසින් ද ආර්ථික දත්ත කාණ්ඩයන්හි උද්ධමයයෙන් ඇතිවන බලපෑම ඉවත් කිරීමට යොදා ගන්නා අවධමනයක් ලෙස ද භාවිතා කළ හැක. මෙම දර්ශකය ඵලදායිතා විශ්ලේෂණයට මෙන් ම කොන්ත්‍රාත් ගිවිසුම් සඳහා අගය තීරණය කිරීමට, ව්‍යාපාර තොරතුරු විශ්ලේෂණය හා ස්ථාවර වත්කම්වල වර්තමානයේ පවතින මිල ගණනය කිරීම් සඳහා ද භාවිතා කරයි.

ආචාර්ය අමර සතරසිංහ
අධ්‍යක්ෂ ජනරාල්
ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව
දුරකථන අංක: 011-2147001 / 011-2147020